VERITÉ RESEARCH
Strategic Analysis for Asia

5 Police Park Place, Colombo 05, Sri Lanka
Tel: + 94 112055544; Fax: +94 719379567
Email: reception@veriteresearch.org

# ප්‍රතිලාභ හිගවූ ශ්‍රී ලංකාවේ වෙළඳ ගිවිසුම්

ශ්‍රී ලංකාව දකුණු ආසියානු කලාපය තුළ නිදහස් වෙළඳාම ප්‍රචලිත කිරීම සඳහා පුරෝගාමීව කටයුතු කල රාජ්‍යයකි. නිදහස් වෙළඳාම සම්බන්ධව ආරම්භයේ දි දැක්වූ උනන්දුව පසුකාලීනව ක්‍රමයෙන් හීනවීමකට ලක්වූ අතර පසුගිය වසර 07 ක කාල පරාසය තුළ ප්‍රධාන වෙළඳ ගිවිසුමකට අත්සන් තැබීමට ශ්‍රී ලංකාව අසමත් වී ඇත. මෙය විදේශ වෙළඳ ගිවිසුම් හා සම්බන්ධ ගැටලුවෙහි එක් පැතිකඩක් පමණි. මීට අදාල වන අනෙක් ගැටලුව වන්නේ ශ්‍රී ලංකාව එළඹ ඇති වෙළඳ  ගිවිසුම් වල ගුණාත්මකභාවය පිළිබඳ ප්‍රශ්නයයි.


ශ්‍රී ලංකාවේ වර්තමානය තුල ක්‍රියාත්මක වන වෙළඳ  ගිවිසුම් ද ප්‍රශස්ථ ප්‍රතිඵල ලබාදෙන මට්ටමක නොපවතින අතර ඊට බලපාන හේතු සාධක කිහිපයකි. දැනට ක්‍රියාකාරී වෙළඳ ගිවිසුම් මගින් ලබා දි ඇති වෙළඳ සහන භාණ්ඩ වර්ග කිහිපයකට පමණක් සීමාවන, ලබා දි ඇති වෙළඳ සහන ද විදේශ වෙළඳාමෙහි නියුතු ව්‍යාපාරිකයන්ට සැලකිය යුතු මට්ටමක ප්‍රතිලාභ ලබාදිමට අසමත් වී ඇත. උදාහරණයක් ලෙස GSTP (දියුණු වෙමින් පවතින රටවල් අතර ගෝලීය වෙලද වාර්තා පද්ධතිය) හා APTA  (ආසියා පැසිෆික් වෙළඳ  ගිවිසුම) යන ප්‍රධාන වෙළඳ  ගිවිසුම් 02 මගින් ලබාදි ඇති භාණ්ඩ ආවරණය ඉතා සීමිත වන අතර භාණ්ඩ ආනයනය කරන රටවල් මගින් ආනයන බදු ඉවත් කිරීම සඳහා ද සැලකිය යුතු මට්ටමක කැපවීමක් සිදුකර නොමැත.

සංකීර්ණ වෙළඳ රෙගුලාසි සහ අමතර බදු පැනවීම මගින්ද ආනයන බදු වලට අමතරව අනවශ්‍ය වෙළඳ  බාධක නිර්මාණය කෙරේ. ඉන්දු ලංකා වෙළඳ ගිවිසුම මගින් ආවරණය වන “සැකසු ආහාර” යන වෙළඳ  භාණ්ඩ ගණය මෙයට කදිම නිදසුනකි. ආනයන බලපත්‍ර ලබාගැනිමේ දි මුහුනදීමට සිදුවන දුෂ්කරතා, භාණ්ඩ සැකසීම හා අදාල වන සෞඛ්‍ය හා සනීපාරක්ෂක රෙගුලාසි වැනි කරුනු මුල්කොට ගනිමින් සැකසූ අහාර අපනයනය සිදුවන්නේ ඉතා සුළු මට්ටමෙනි.  තවද ශ්‍රී ලංකාව අත්සන් තබා ඇති වෙළඳ ගිවිසුම වල අන්තරගත ප්‍රභවය හා සම්බන්ධ නීති (rules of origins) මගින්ද භාණ්ඩ අපනයනය ඉතා දැඩි ලෙස සීමාකිරීම් වලට භාජනය කොට ඇත. උදාහරනයක් ලෙස ඉන්දියාව ශ්‍රී ලංකානු ඇගළුම් කොටස්

මිලියන 8 කට පමණ වරනීය පිවිසුම් ලබා දී තිබෙන අතර මේ සඳහා සැපිරිය යුතු කොන්දේසිය වන්නේ එම ඇගළුම් සකස් කිරීම සඳහා යොදා ගන්නා රෙදිපිළි ඉන්දියානු නිෂ්පාදනයක් වීමයි. 2008 දි මෙම වෙළඳ කොන්දේසිය සීමිත ලෙස ලිහිල්කරණයකට ලක් වූ අතර එමගින් ප්‍රභවය හා සම්බන්ධ නීති මගින් සීමාකිරීමට ලක්නොවුනු ඇගළුම් කොටස් මිලියන 3 ක් අපනයනය කිරීමට අවකාශ ලබා දෙන ලදි. නමුත් ප්‍රභවය හා සම්බන්ධ නීතියේ බලපෑමට යටත් ඇගළුම් කොටස් මිලියන 5 ක අපනයන අවකාශය තවමත් ප්‍රශස්ථ ලෙස උපයෝජනය කිරීමට ශ්‍රී ලංකාව අසමත් වී ඇත.

2013 මැයි මාසයේදි ශ්‍රී ලංකාව චීනය සමග නව වෙළඳ ගිවසුමකට එලඹීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීමට කමිටුවක් ස්ථාපිත කිරීමට එකගතාවය ඇති කර ගන්නා ලදී. මෙහිදී ශ්‍රී ලංකාව චීනයට සිදුකරන අපනයන ප්‍රමානය වැඩි කරගැනීම සඳහා සුවිශේෂි අවධානයක් යොමු කිරීම වැදගත් වේ. ඒ මක්නිසාදයත් ශ්‍රී ලංකාව හා චීනය අතර වෙළඳ හිගය පසුගිය වසර කිහිපය තුළ ඉතා වේගයෙන් ප්‍රසාරණය වීමකට භාජනය ඇති නිසාවෙනි (රූප සටහන 01).

<u>රූප සටහන 01</u>



මෙම වෙළඳ අවස්ථාව නිසිලෙස උපයෝජනය කිරීමට කටයුතු කිරීම කරුණු කිහිපයක් මත වැදගත් වේ. චීනය නුදුරු අනාගතයේ දී ලොව විශාලතම ආර්ථිකයට හිමිකම් කීමට පිය මනිමින් සිටින අතර එය දැනට ලොව විශාලතම අපනයන ආර්ථිකය සහ දෙවන විශාලතම ආනයන ආර්ථිකය ද වේ. අනෙකුත් දියුණු වෙමින් පවතින රටවල් මෙම සුවිශේෂී වෙළඳ අවස්ථාවෙහි ප්‍රයෝජනයන් පිළිබඳව මනා අවබෝධයකින් යුතුව සිය අපනයන දිශානතිය ක්‍රමයෙන් චීනය දෙසට නැඹුරු කර ගැනීමකට දැනටමත් පියවර ගෙන තිබේ (අපනයන දිශානතිය මගින් යම් කිසි රටක මුලු අපනයන වටිනාකමින් කවර ප්‍රතිශතයක් කුමන රටකට අපනයනය කරන්නේ ද යන්න පිළිබඳ විවරණයක් සපයයි.). උදාහරණයක් ලෙස ඉන්දියාව හා වියට්නාමය තම අපනයන දිශානතිය තුල චීනය 03 වන ස්ථානය තෙක් ඉහලට ගෙන ඒමට සමත් වී ඇති නමුත් ශ්‍රී ලංකාවේ අපනයන දිශානතිය තුල චීනයට තවමත් හිමිවන්නේ 16 වැනි ස්ථානයයි. (අංක සටහන 01:)

<u>අංක සටහන 01: දියුණු වෙමින් පවතින රටවල වෙළඳ දිශානතිය තුළ චීනයේ සාපේක්ෂ වැදගත්කම</u>

| රට | අපනයන දිශානතිය තුළ චීනයේ වැදගත්කම | චීනයට සිදුකරන අපනයන වල වටිනාකම මුළු අපනයන වල ප්‍රතිශතයක් ලෙස |
|---|---:|---:|
| දකුණු කොරියාව | පළමුවන ස්ථානය | 25.0% |
| තායිලන්තය | පළමුවන ස්ථානය | 11.0% |
| වියට්නාමය | තුන්වන ස්ථානය | 9.2% |
| ඉන්දියාව | තුන්වන ස්ථානය | 7.9% |
| බ්‍රසීලය | පළමුවන ස්ථානය | 15.6% |
| චිලි රාජ්‍යය | පළමුවන ස්ථානය | 24.6% |
| දකුණු අප්‍රිකාව | පළමුවන ස්ථානය | 11.4% |
| ශ්‍රී ලංකාව | දහසය වන ස්ථානය | 1.2% |

මේ ආකාරයට චීනය හා වෙළඳ ගිවිසුමකට එළඹීමට මනා පරිසරයක් නිර්මාණය වී ඇති නිසාවෙන්ම සියල්ල ප්‍රශස්ථ මට්ටමින් සිදුවේ යැයි අපේක්ෂා කල නොහැකිය. මෙවැනි වෙළඳ ගිවිසුමක සාර්ථක හෝ අසාර්ථක බව කෙරෙහි බලපෑ හැකි කරුණු පිළිබඳව මනා අවබෝධයකින් යුතුව ක්‍රියා කිරීම ඉතා වැදගත් වේ.

වෙළඳ ගිවිසුමක සාර්ථකත්වය සඳහා ආර්ථික මෙන්ම දේශපාලනික කරුණු ද ඉතා වැදගත් වේ. මෙලෙස වෙළඳ ගිවිසුමකට එළඹීමේ දි එහි සාර්ථකත්වය දේශපාලන අභියෝග දෙකක් මත රදා පවතී. මින් පළමු අභියෝගය චීනය හා බැඳී පවතී. ශ්‍රී ලංකාව චීනයට

සාපේක්ෂව ඉතා කුඩා වෙළඳ පොලකි. එම නිසා වෙළඳ පොළට පිවිසීමට අවකාශ ලබාදීම තුලින් පමණක්ම වෙළඳ  සහන ආකර්ශණය කර ගැනීමට ශ්‍රී ලංකාවට ඇති හැකියාව සීමිත වේ. දෙවැනි අභියෝගය අභ්‍යන්තර කරුනු හා බැඳී පවතී. ඇතැම් දේශීය කර්මාන්ත වල පෞද්ගලික අභිරුචියන්, රජයේ කෙටි කාලීන අදායම් අපේක්ෂාවන් වැනි කරුණුද වෙළඳ ගිවිසුමක් තුල අන්තර්ගත කිරීමට අවකාශ පවතී.

ශ්‍රී ලංකා රජය චීනය සමග වෙළඳ ගිවිසුමකට එළඹීමට දරන උත්සාහය ප්‍රශංසනීය වේ. නමුත් මෙහිදී චීනය විසින් ශ්‍රී ලංකාවට වාසි ගෙන එන අපනයන දිරිගැන්වෙන ගිවිසුමකට අත්සන් කිරීමට තරම් පෙළඹවීමක් ඇතැයි සිතා කටයුතු කලහොත් එය බලවත් වරදකි. මක්නිසාදයත් වෙළඳ ගිවිසුමකදි ඕනෑම රටක් තමන්ට ලැබෙන ප්‍රතිලාභ වලට ප්‍රමුඛස්ථානය දෙමින් ගනුදෙනු කිරීම සිදුකරන නිසාවෙනි. එම නිසා ශ්‍රී ලංකාව මීට පෙර එලඹි වෙළඳ ගිවසුම් වල තිබූ අඩුලුහුඩුකම් පිළිබඳව මනා අධ්‍යයනයක් සිදුකොට ප්‍රශස්ත ප්‍රතිඵල ගෙන දෙන වෙළඳ ගිවිසුමක් ඇතිකර ගැනිමට ක්‍රියාපටිපාටියක් සැලසිම ඉතා වැදගත් වේ. මෙහිදි ජාත්‍යන්තර වෙළඳ නියාමනය පිළිබද නිසි අවබෝධයකින් පසු වීම, ප්‍රදේශීය හා ගෝලීය දේශපාලන ප්‍රවනතාවයකින් පිළිබද දැනුවත්භාවය හා වෙළඳ ගිවිසුමට එළඹෙන රාජ්‍යය හා පවතින අන්‍යෝන්‍ය ලැදිකම වැනි කරුණු පිළිබදව දැඩි සැලකිල්ලකින් යුතුව කටයුතු කිරීම ඉතා වැදගත් වේ.

සමස්තයක් ලෙස බැලීමේ දි පෙර වෙළඳ ගිවිසුම් වලදි දැක්වූ වෙළඳ නිපුනතාවයට එහා ගිය තීව්‍ර ගනුදෙණු කිරීමේ හැකියාවන් ප්‍රදර්ශනය කිරීම චීනය හා වෙළඳ ගිවිසුමක සාර්ථකත්වය තීරණය කරන ප්‍රබල සාධකයක් වනු ඇත.

**වෙරිටේ රිසර්ච් (Verité Research) යනු රාජ්‍ය අංශයට උපාය මාර්ගික හා ප්‍රතිපත්ති සම්පාදනය සඳහා උපදෙස් ලබා දෙන සහ පෞද්ගලික අංශයට ආර්ථික විද්‍යාත්මක, නීතිමය, මාධ්‍ය හා දේශපාලනික ක්ෂේත්‍ර ඔස්සේ උපදේශණ සේවා ලබාදෙන පර්යේෂණ ආයතනයකි.**